*සැ. යු.* - 2018.05.11 වැනි දින පළ වූ අංක 2071 දරන *ගැසට්* පත්‍රයේ I: III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,072 - 2018 මැයි මස 18 වැනි සිකුරාදා - 2018.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 84 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජුනි මස 08 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මැයි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ 4 වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රණසිංහ මුත්තෙට්ටුගේ දර්ශනා රණසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2000.04.03 දින ප්‍රදනය කර ඇති අංක කළු/ප්‍ර/දො/1136 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කොස්හේන, බෝම්බුවල පදිංචි පාලයන්ගොඩගේ සිමෙල් වෙත ප්‍රදානය කොට කළුතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්.ඩී.ඕ. 21/138 යටතේ 2000.08.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2018.06.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ දෙඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කළුතර තොටමුණ පත්තුවේ 728 සී බෝම්බුවල උතුර බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බෝම්බුවල නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක එල්/22/52 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි ඇති අංක මු.පි.ක. 606 දරන පිඹුරෙහි අංක 40 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් පර්චස් 39 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම: දෙගල්දෙර කැලේ,

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු.පි.ක. 606 කැබලි අංක 43 සහ 47; |
| *නැගෙනහිරට* | : | මු.පි.ක. 606 කැබලි අංක 43 සහ 41; |
| *දකුණට* | : | කැබලි අංක 11 (පාර); |
| *බස්නාහිරට* | : | මු.පි.ක. 606 කැබලි අංක 47. |

ආර්. එම්. දර්ශනා රණසිංහ,
ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්),
දොඩන්ගොඩ.

2017 දෙසැම්බර් මස 20 වැනි දින.

05 - 456/1

## අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ 4 වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රණසිංහ මුත්තෙට්ටුගේ දර්ශනා රණසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.12.07 දින ප්‍රදානය කර ඇති අංක කළු/ප්‍ර/දො/372 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කඳනගොඩ, දෙඩන්ගොඩ පදිංචි ජාගොඩ ආරච්චිගේ නන්දාවතී වෙත ප්‍රදානය කොට මතුගම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්.ඩී.ඕ. 53/156 යටතේ 1996.03.13 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2018.06.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ දෙඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉද්දගොඩ පත්තුවේ 800 ඩී බටහිර, දොඩන්ගොඩ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර දොඩන්ගොඩ, උතුර කජුදූවකැලේ නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 73/25/4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි ඇති අංක මු.පි.ක. 2435 දරන පිඹුරෙහි අංක 07 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.096 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම: කජුදූව කැලේ,

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු.පි.ක. 2435 කැබලි අංක 03 සහ 02; |
| *නැගෙනහිරට* | : | මු.පි.ක. 2435 කැබලි අංක 02, 08 සහ 10; |
| *දකුණට* | : | මු.පි.ක. 2435 කැබලි අංක 10 සහ 11 (මාර්ගය); |
| *බස්නාහිරට* | : | මු.පි.ක. 2435 කැබලි අංක 06 සහ 11 (මාර්ගය). |

ආර්. එම්. දර්ශනා රණසිංහ,
ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්),
දොඩන්ගොඩ.

2017 දෙසැම්බර් මස 11 වැනි දින.

05 - 456/2

### අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ 4 වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රණසිංහ මුත්තෙට්ටුගේ දර්ශනා රණසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.12.17 දින ප්‍රදානය කර ඇති අංක කළු/ප්‍ර/3701 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන විල්පාත, දෙඩන්ගොඩ පදිංචි ආටිගලගේ දොන් බාරොන් වෙත ප්‍රදානය කොට මතුගම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්.ඩී.ඕ. 28/1 යටතේ 1992.03.23 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2018.06.30 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉද්දගොඩ පත්තුවේ 800 ඒ නැගෙනහිර, දොඩන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දොඩන්ගොඩ, නැගෙනහිර නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක මු.පි.ක. 160 දරන පිඹුරෙහි අංක 21 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 02 යි පර්චස් 15 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම කැකුණගහලන්ද *නොහොත්* කහවෙල්තුඩුවේලන්ද,

| | | |
|---|---|---|
| *උතුරට* | : | හි. පි. 62510; |
| *නැගෙනහිරට* | : | හි. පි. 62510; |
| *දකුණට* | : | මු.පි.ක. 160 හි ලොට් 22 සහ හි. පි. 62510; |
| *බස්නාහිරට* | : | මු.පි.ක. 160 හි ලොට් 20 (පාර). |

ආර්. එම්. දර්ශනා රණසිංහ,
ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්),
දොඩන්ගොඩ.

2017 දෙසැම්බර් මස 14 වැනි දින.

05 - 456/3